# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 5 දරන
# ජාතිය රැකගැනීමේ
# දායක මුදල් පනත

---

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 මාර්තු මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත

[සහතිකය සටහන් කළේ 1966 මාර්තු මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 65/95

1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා ම ජාතිය රැක ගැනීමේ දායක මුදලක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1966 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (1) මේ පනතේ විධිවිධාන— — පනත අදාළ වීම.

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවයේ සාමාජිකයකු වශයෙන් ; හෝ

(ii) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන්

වන යම් ධුරයකින් හෝ සේවානියුක්තියකින් ලබන ලාභ කිසිවක් හැර, (දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ අර්ථානුකූලව ලාභ වන) යම් ධුරයකින් හෝ යම් සේවානියුක්තියකින් ලාභ ලබන (මෙහි මින් මතු "සේවානියුක්තයකු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු ; හෝ

(ආ) (ඇ) ඡේදයෙහි සඳහන් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වශයෙන් හැර යම් වෘත්තියක්, රක්ෂාවක් හෝ ස්වාධීන ස්වරූපයකින් යුත් සමාන රැකියාවක් කර ගෙන යන හෝ ක්‍රියාත්මක කරන (මෙහි මින් මතු "ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු ; හෝ

(ඇ) යම් වෘත්තියක්, රක්ෂාවක් හෝ ස්වාධීන ස්වරූපයකින් යුත් සමාන රැකියාවක් වෙනත් තැනැත්තන් සමඟ හවුල් ව්‍යාපාරයක් වශයෙන් කර ගෙන යන හෝ ක්‍රියාත්මක කරන (මෙහි මින් මතු "හවුල්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු ; හෝ

(ඈ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හෝ සේවානියුක්තයකු සහ හවුල්කරුවකු නැතහොත් ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු ; හෝ

(ඉ) සේවානියුක්තයකු හා ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු

වන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුට ම අදාළ විය යුතු ය.

2—ඩී 038730—6630 (95/12)

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු ම, මේ පනතෙහි මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ජාතිය රැක ගැනීමේ දායක මුදල පැනවීම.

3. (1) මේ පනතේ පසුව සඳහන් විධිවිධානවලට යටත්ව, (මේ පනතෙහි මින් මතු "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සෑම කාර්තුවක් සඳහා ම, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති උචිත අනුප්‍රමාණ අනුව, මේ පනත අදාළ වන සෑම තැනැත්තකුගේ පඩිනඩි මත ගණන් බලනු ලබන (මේ පනතෙහි මින් මතු "දායක මුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතිය රැක ගැනීමේ දායක මුදලක්" ඒ තැනැත්තාගෙන් අය කර ලබා ගත යුතු ය.

(2) මේ පනතේ පසුව සඳහන් විධිවිධානවලට යටත්ව, යම් අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකු විසින් ගෙවිය යුතු දායක මුදල, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

සේවා නියුක්තයන්ගේ දායක මුදල, සේවායෝජක විසින් අඩු කර ගනු ලැබිය යුතු බව.

4. සේවානියුක්තයකු වන මේ පනත අදාළ වන්නා වූ සෑම තැනැත්තකුගේම සේවායෝජක විසින්, අදාළ කාර්තුවක සෑම මාසයක් සඳහා ම ඒ මාසය සඳහා ඒ සේවායෝජක විසින් ඒ තැනැත්තාට ගෙවිය යුතු පඩිනඩිවලින්—

(i) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ මාසික පඩිනඩි වල මුළු එකතුව රුපියල් හතලිස් පන් දහසක් ඉක්මවන එහෙත් රුපියල් අනූදහසක් නොඉක්මවන්නේ නම්, ඒ මාසය සඳහා ඒ තැනැත්තාගේ පඩිනඩිවලින් සියයට දෙකකට; නැතහොත්

(ii) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ මාසික පඩිනඩිවල මුළු එකතුව රුපියල් අනූදහස ඉක්මවන්නේ නම්, ඒ මාසය සඳහා ඒ තැනැත්තාගේ පඩිනඩිවලින් සියයට තුනකට

සමාන මුදලක් අඩුකර, ඒ මුදල එසේ අඩුකර ගන්නා ලද මාසය අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී දායක මුදල, සේවායෝජක ගෙන් අයකර ගනු ලැබිය යුතු බව.

5. අදාළ කාර්තුවක යම් මාසයක් සඳහා යම් සේවායෝජකයකු විසින් 4 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ වගන්තිය යටතේ අඩුකර ප්‍රේෂණය කිරීමට නියම කර ඇති යම් මුදලක්, අඩුකර ගැනීම පැහැර හරින හෝ අඩුකර ගෙන ප්‍රේෂණය කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ මුදල් ඒ සේවායෝජක ගෙන් අයකර ගනු ලැබිය හැකි ය. ඒ සේවායෝජක විසින් අඩු කර ගෙන ප්‍රේෂණය කිරීමට එසේ නියම කර ඇති ඒ මුදල් තක්සේරු කිරීම, ගෙවීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් සහ ඒ මුදල් ගෙවීම පැහැර හැරීම සඳහා වූ දණ්ඩන මුදල් සම්බන්ධයෙන්, දේශීය ආදායම් පනතේ 107, 108, 109 සහ 110 වන වගන්ති වල හා XXI වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

*දායක මුදල සහ 4 වන වගන්තිය යටතේ අඩු කර ගන්නා ලද මුදල් අතර වූ වෙනස සේවානියුක්තියා විසින් ගෙවිය යුතු බව.*

**6.** සේවානියුක්තයකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් 4 වන වගන්තිය යටතේ, අදාළ කාර්තුවක් සඳහා අඩු කර ප්‍රේෂණය කරනු ලැබූ මුදල්වල මුළු එකතුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු දායක මුදලට වඩා අඩු වන අවස්ථාවක දී, ඒ දායක මුදල සහ එසේ අඩු කර ප්‍රේෂණය කරන ලද මුදලේ මුළු එකතුව අතර වූ වෙනස, ඒ කාර්තුව අවසානයේ සිට දින පහළොවක් ඇතුළත, ඒ තැනැත්තා විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

*පැහැර හැරීම සඳහා දණ්ඩනය.*

**7.** (1) මේ පනත අදාළ වන තැනැත්තකු විසින් ගෙවිය යුතු දායක මුදලක් හෝ එහි කොටසක්, ඒ දායක මුදල ගෙවීම සඳහා 3 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් දින හෝ එදිනට පෙර ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල හෝ එහි කොටස නැතහොත්, යම් අදාළ කාර්තුවක් සඳහා තක්සේරු කරුවකු විසින් තක්සේරු කරනු ලැබ, යම් දායක මුදලක් හෝ එහි කොටසක් තක්සේරු දැන්වීමෙහි සඳහන් දිනයේ දී හෝ එදිනට පෙර ගෙවන ලෙස නියම කර තිබිය දී ඒ දායක මුදල හෝ එහි කොටස ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල හෝ එහි කොටස, අවස්ථාවෝචිත පරිදි, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් දිනයේ සිට හෝ තක්සේරු දැන්වීමෙහි සඳහන් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ඒ දිනයෙහි සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් දායක මුදලක් හෝ එහි කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, පැහැර හරිනු ලැබූ ඒ දායක මුදල හෝ එහි යම් කොටසට අමතරව, පැහැර හරින්නා විසින්—

(i) පැහැර හරිනු ලැබූ මුදලින් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ දායක මුදල ගෙවීම පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව දින තිහක් ඉකුත්වීමට පෙර ඒ දායක මුදල් ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල ගෙවීම පැහැර හරිනු ලැබ පවත්නා කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාලයක් හෝ එහි කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ දායක මුදලින් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක්

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩන මුදලක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, කිසිම අවස්ථාවක දී, ගෙවීම පැහැර හැර ඇති දායක මුදලින් සියයට පනහක් නොඉක්මවිය යුතු ය.

අයකර ගැනීම ආදිය සම්බන්ධයෙන් අදාළ විධිවිධාන.

8. වාර්තාවලට, තක්සේරු කිරීම්වලට, තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවයට සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන වලට, ආදායම් බදු අයකර ගැනීම හා ආපසු ගෙවීමට අදාළ දේශීය ආදායම් පනතේ (94 වන සහ 95 වන වගන්ති හැර) XIII වන පරිච්ඡේදයේ සහ XVII, XIX, XXI සහ XXIII වන පරිච්ඡේද වල විධිවිධාන ද ආදායම් බදුවලට එරෙහිව වූ අභියාචන වලට අදාළ ඒ පනතේ XVIII වන පරිච්ඡේදය ද, විවිධ කරුණු දණ්ඩන හා වැරදි සහ ඒ පනත යටතේ වූ පොදු කාරණාවලට අදාළ ඒ පනතේ XXII, XXIV හා XXVI වන පරිච්ඡේද ද, ඒ පනතේ පරිපාලනයට අදාළ ඒ පනතේ XXV පරිච්ඡේදය ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වූ තක්සේරු කිරීම්වලට, තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවයට වැරදි වාර්තාවලට, දායක මුදල් අයකර ගැනීමට සහ ආපසු ගෙවීමට, ඒ දායක මුදල්වලට එරෙහිව වූ අභියාචනවලට, විවිධ කරුණුවලට, දණ්ඩනවලට හා වැරදිවලට සහ පොදු කාරණාවලට ද, මේ පනතේ පරිපාලනයට ද අදාළ විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"කොමසාරිස් ජනරාල්වරයා", "තැනැත්තා" සහ "ප්‍රමුඛ හවුල් කරු" යන යෙදුම්වල දේශීය ආදායම් පනතෙහි ඒවාට දී ඇති ඒ ඒ අර්ථ ම ඇත්තේ ය ;

"සේවා යෝජක" යන්නෙන්—

(අ) සේවා නියුක්තයකු ලෙස යම් පුද්ගලයකු සේවා ඉටු කරන්නේ යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාර යක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධාන යක් සඳහා ද ඒ තැනැත්තා, ඒ හවුල් ව්‍යාපාරය, ඒ පුද්ගල මණ්ඩලය හෝ ඒ සංවිධානය ;

(ආ) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ අර්ථානු කූලව සේවානියුක්තියෙන් වන යම් ලාභ ගෙවන යම් තැනැත්තකු, හවුල් ව්‍යාපාරයක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් ;

(ඇ) කලින් සේවානියුක්තයකුව සිටි සේවානියුක්තය කුගේ පූර්ව සේවා සඳහා ඒ සේවානියුක්තයාට හෝ වෙනත් යම් තැනැත්තකුට යම් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් යම් පාරිශ්‍රමිකයක් ගෙවන යම් තැනැත්තකු, හවුල් ව්‍යාපාරයක්, පුද්ගල මණ්ඩල යක් හෝ යම් සංවිධානයක්

අදහස් වන අතර, මෙහි පහත I වන තීරයෙහි සඳහන් මණ්ඩලයක්, ආයතනයක් නැතහොත් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, II වන තීරයෙහි අනුරූප සටහනෙහි සඳහන් තැනැත්තා ඊට ඇතුළත් වේ :—

| I වන තීරය | II වන තීරය |
| --- | --- |
| 1. සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක්. | ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්වරයා, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයා. |
| 2. හවුල් ව්‍යාපාරයක්. | ප්‍රමුඛ හවුල්කරු හෝ ශ්‍රී ලංකාවෙහි පදිංචි යම් සක්‍රිය හවුල්කරුවකු සහ කිසිම සක්‍රිය හවුල්කරුවකු ශ්‍රී ලංකාවෙහි පදිංචිව නොසිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා. |
| 3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා. | පඩිනඩි ගෙවීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තා |
| 4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකු, පළාත් ආණ්ඩුකාරවරයකු, පළාතක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු. | —එම— |
| 5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ අර්ථ කථනය කර ඇති පරිදි, යම් අධිකරණ නිලධරයකු. | —එම— |
| 6. දේශීය ආදායම් පනතේ 9 (1) (ආආ) (x) වන වගන්තියේ සඳහන් තැනැත්තකු. | —එම— |

පඩිනඩි’ යන්න, යම් අදාළ කාර්තුවක් සඟ—

(අ) සේවානියුක්තයකු වන, මේ පනත අදාළ වන්නා වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, දේශීය ආදායම් පනතේ 4(1) (අ) (1) වන වගන්තියේ අර්ථානුකූලව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ සේවානියුක්තියෙන් වන අතිකාල ගෙවීම් හැර (ශ්‍රී ලංකාව තුළදී උද්ගත වන, උපචිත වන හෝ ගෙවනු ලබන) ලාභ ඉන් අදහස් වේ ;

(ආ) ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තා කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන වෘත්තියෙන්, රක්ෂාවෙන් හෝ ස්වාධීන ස්වරූප යකින් යුත් සමාන රැකියාවෙන් ඒ කාර්තුව සඳහා ලැබෙන, 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ අර්ථානුකූලව පිරිවැටුමෙන් සියයට පනහක් ඉන් අද හස් වේ ;

(ඇ) හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ යම් තැනැත් තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ හවුල්කරු, හවුල්කරු වකු වන හවුල් ව්‍යාපාරයේ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ අර්ථානුකූලව ඒ කාර්තුව සඳහා වන පිරිවැටුමෙන් සියයට විසිපහක ප්‍රමාණයක්, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන් අතර, ඒ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභ බෙදා හරිනු ලබන අනුපාතය අනුව බෙදාහරිනු ලබන්නේ නම්, ඒ හවුල්කරුට ආරෝපණය කළ හැකි ඒ පිරිවැටුමේ ඒ කොටස ඉන් අදහස් වේ ;

(ඈ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු නැතහොත් සේවානියුක්තයකු සහ හවුල් කරුවකු හෝ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්-තකු සම්බන්ධයෙන් යෙදෙන විට, අවස්ථාවෝචිත පරිදි, (අ) ඡේදයෙහි සඳහන් ලාභ සහ (ආ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ ප්‍රතිශතය යන්නෙහි මුළු එකතුව හෝ (අ) ඡේද යෙහි සඳහන් ලාභ සහ (ඇ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව හෝ (ආ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ ප්‍රතිශතය සහ (ඇ) ඡේදයේ සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව ඉන් අදහස් වේ ;

(ඉ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හා හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, (අ) ඡේදයෙහි සඳහන් ලාභ සහ (ආ) ඡේදයෙහි සඳහන් පිරි වැටුමේ ප්‍රතිශතය හා (ඇ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව ඉන් අදහස් වේ.

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ.

## උපලේඛනය

(8 වන වගන්තිය)

| අදාළ කාර්තුවක් සඳහා වූ පඩිනඩි | අනුප්‍රමාණය |
| --- | --- |
| අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි, රුපියල් හතලිස් පන් දහසක් නොඉක්මවන අවස්ථාවක. | නැත. |
| අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි, රුපියල් හතලිස් පන් දහසක් ඉක්මවන එහෙත් රුපියල් අනූදහසක් නොඉක්මවන අවස්ථාවක | ඒ පඩිනඩිවලින් සියයට 2. |
| අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි රුපියල් අනූදහසක් ඉක්මවන අවස්ථාවක | ඒ පඩිනඩිවලින් සියයට 3. |